


නවදිල්ලි නගරයේදී ජනවාරි 01, 2023 දින ස්කූටර් රථයකින් ගමන් ගත් තරුණියක මෝටර් රථයක ගැටී අනතුරට පත් වීම සහ, එම මෝටර් රියට යට වූ තරුණිය කිලෝමීටර් ගණනාවක් මෝටර් රිය සමඟින් ඇදී ගොස් මිය යෑම පිළිබඳ පුවත, දෙස් විදෙස් මාධ්‍ය අවධානයට ලක්ව තිබිණි. එහිදී දේශීය මාධ්‍යයක් සහ විදේශීය මාධ්‍යයක් එම පුවත වාර්තා කොට තිබූ ආකාරය, Ethics Eye අපි මින් පෙර ද සංසන්දනාත්මකව ඉදිරිපත් කළෙමු.

මෙම පුවතම, ඉරිදා මව්බිම (ජන. 08, 2023) විශේෂාංග ලිපියක් ඔස්සේ සහ BBC News (ජන. 03, 2023) ඔස්සේ ආවරණය වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.

මව්බිම සිරස්තලය - "සුන්දර අන්ජලී මස් වැදැල්ලක් කළ බේබදු නරුමයන්ගේ අපරාධයක තරම..!" (අන්තර්ගතය - "තරුණකම මෙන්ම රූමත් බවද ඇයට නොඅඩුව තිබිණි... රිය අනතුර සිදුවූ තැනින් කි.මී.දොළහකටත් වඩා දුර මහමඟ වැටී තිබූ අන්ජලීගේ සිරුරේ ඇඳුම් කීතු කීතු වලට ඉරී තිබිණි. අනතුර සිදුකළ සුසුකි මරුති වර්ගයේ කාරය තුළ සිට ඇත්තේ බීමත් තරුණ පිරිමින් පස් දෙනෙකි...")

BBC News - "Delhi hit-and-run: Young woman's horrific death shocks India"

1) ඉරිදා මව්බිම ලිපිය මෙම සිදුවීම දැක්වීමේ දී, එම අනතුරට පත්ව මිය ගිය තරුණියගේ බාහිර ස්වරූපය, "සුන්දර", "රූමත්" වැනි විශේෂණ ඔස්සේ දක්වා ඇත්තේ මන්ද? ඒ මෙම පුවතට හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබාදීමට ද?

2) එසේම, BBC News සිරස්තලය හා සසඳන විට, ඉරිදා මව්බිම සිරස්තලය අතිශයින්ම හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) යැයි ඔබ නොසිතන්නේ ද?

3) මෙවැනි පුවතක් මෙසේ හැඟීම් කළඹවන සුළු අයුරින් ඉදිරිපත් කිරීම ඔස්සේ, මෙම සිදුවීමෙහි අවධානයට ලක් විය යුතු කරුණු පාඨක අවධානයෙන් ගිලිහී යෑමේ අවදානමක් නොමැති ද?

මෙම සිදුවීමට අදාළව මින් පෙර අප ඉදිරිපත් කළ පුවතට සබැඳිය: Facebook

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.